රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය
அரசாங்க நிருவாகச் சுற்றறிக்கை
Public Administration Circular

අංකය
இல.
No. 41

# බැඳුම්කර හා/හෝ ගිවිසුම් අත්සන් කර ඇති රජයේ නිලධාරීන් විශ්‍රාම ගැනීම

# முறிகள் அத்துடன்/அல்லது ஒப்பந்தங்கள் செய்துள்ள அரசாங்க உத்தியோகத்தர்களின் இளைப்பாறல்

# Retirement of Public Officers Who have Entered into Bonds and/or Agreements

ආයතන මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series 32

මිළ/விலை/Price : -/20

තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/15

# බැඳුම්කර හා/හෝ ගිවිසුම් අත්සන් කර ඇති
# රජයේ නිලධාරීන් විශ්‍රාම ගැනීම

නිශ්චිත අනිවාර්ය සේවා කාලයක් රජයට සේවය කිරීමට බැඳුම්කරයක් හා/හෝ ගිවිසුමක් අත්සන් කර ඇති රජයේ සේවකයින්ට ඔවුන්ගේ වයස 55 සම්පූර්ණ වන තුරු විශ්‍රාම ගැනීමට අවසර නොදිය යුතුයයි රජය තීරණය කර තිබේ.

2. මේ තීරණයේ ප්‍රතිඵල මෙසේ ය—

(i) කිසි නිලධාරියකුට ඔහු විසින් අත්සන් කරන ලද බැඳුම්කරය හා/හෝ ගිවිසුම වලංගුව පවතිද්දී විශ්‍රාම ගැනීමට අවසර නොලැබෙනු ඇත.

(ii) කෙසේ වූවද, වයස අවුරුදු 55 න් ඔබ්බට දිවෙන අනිවාර්ය සේවා කාලයක් නියම කරන බැඳුම්කරයක් හා/හෝ ගිවිසුමක් අත්සන් කර ඇති නිලධාරියකුට, බැඳුම්කරය හා/හෝ ගිවිසුම යටතේ ගෙවිය යුතු යම් මුදලක් වේ නම් එය ගෙවීමට යටත්ව, වයස අවුරුදු 55 සම්පූර්ණ වූ විට විශ්‍රාම ගැනීමට අවසර දිය හැකිය.

(iii) භාෂා ප්‍රතිපත්තිය යටතේ විශ්‍රාම ගැනීමේ කාර්යය සඳහා අංක 298 හා 56.2.23 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ප්‍රමාණානුකූල දඩයක් ගෙවීමෙන් බැඳුම්කරයක හා/හෝ ගිවිසුමක බැඳීම්වලින් නිදහස් කිරීමක් ලබා ගැනීමට එම බැඳුම්කරය හා/හෝ ගිවිසුම යටතේ සිටින නිලධාරියකුට අවසර දෙන අංක 700 හා 66.9.4 දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දක්වෙන සහනය ඉවත් කෙරේ.

(iv) බැඳුම්කර හා/හෝ ගිවිසුම් යටතේ සිටින නිලධාරීන් සම්බන්ධයෙන් නම්, රජයේ සේවයේ නියම කාලයට පෙර වන්නාවූ අන් සියලු විශ්‍රාම ගැනීම් පිළිබඳව ඉහත (iii) හි සඳහන් සහනයද, ඉවත් කෙරේ.

3. අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කර ඇත්තාවූ, නැතහොත් තවදුර සේවයට නුසුදුසුයයි නිසි පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තා වූ රජයේ සේවකයින් නියම කාලයට පෙර විශ්‍රාම ගැනීම මේ තීරණය නිසා නොවැළකේ.

4. මේ චක්‍රලේඛය 1971 ඔක්තෝබර් 27 දින සිට ක්‍රියාත්මක වේ. ඔබේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ට මෙය ගැන දැනගන්ට සැලැස්විය යුතුය.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1971 නොවැම්බර් මස 24 දින,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.
අංකය : 2/3/9 (එච්) III.